මොරවැව ප්‍රාදේශීය සභාව
-----------------------------
ත්‍රිකුණාමලය දිස්ත්‍රික්කය
---------------------------

1. මූල්‍ය ප්‍රකාශන
------------------

1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම
-------------------------------

2017 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2018 මාර්තු 29 දින විගණනයට ඉදිරිපත් කර තිබූ අතර, එම මූල්‍ය ප්‍රකාශන පිළිබඳ විගණකාධිපතිවරයාගේ වාර්තාව 2018 අගෝස්තු 17 වැනි දින සභාපතිවරයාට යවා ඇත.

1.2 තත්ත්වාගණනය කළ මතය
------------------------------

මෙම වාර්තාවේ 1.3 ඡේදයේ දක්වා ඇති කරුණු වලින් වන බලපෑම හැර මූල්‍ය ප්‍රකාශන වලින් 2017 දෙසැම්බර් 31 දිනට මොරවැව ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්ම වලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

1.3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම
----------------------------------------

1.3.1 ගිණුම්කරණ අඩුපාඩු
-----------------------

පහත සඳහන් ගිණුම්කරණ අඩුපාඩු නිරීක්ෂණය විය.

(අ) සමාලෝචිත වර්ෂයට අදාල ස්ථාවර තැන්පතු පොළී ආදායම රු.736,031 ක් වුවත් එය රු.1,329,275 ක් ලෙස ගිණුම්වලට ගැනීමෙන් ප්‍රවර්ථන වර්ෂයේ ආදායම රු.593,244 ක් වැඩියෙන් දක්වා තිබුණි.

(ආ) අත්තිකාරම් ගිණුමේ ශේෂය රු.2,000,000 ක් විය යුතු වුවත් ශේෂ පත්‍රයේ අත්තිකාරම් ලෙස රු. 1,891,984 ක් දක්වා තිබුණි.

(ඇ) සභාව විසින් සමාලෝචිත වර්ෂයේ මිලදී ගත් රු.185,600 ක් වටිනා කාර්යාල උපකරණ, රු.55,450 ක් වටිනා යන්ත්‍ර සූත්‍ර හා රු.4,203 ක් වටිනා පුස්තකාල පොත් ප්‍රාග්ධනිත කර නොතිබුණි.

(ඈ) ප්‍රාදේශීය සභා ශක්තිමත් කිරීමේ ජාතික වැඩසටහන යටතේ මහදිවුල්වැව ජල සැපයුම සංවර්ධනය සඳහා පළාත් පාලන දෙපාර්තමේන්තුව විසින් ලබා දෙනු ලැබූ මුදල වූ රු. 496,690 ක් කුලී ආදායම් යටතේ ගිණුම්ගත කර තිබුණි.

(ඉ) පුරනැගුම ව්‍යාපෘතිය යටතේ ඉදිකරන ලද ව්‍යාපෘතිවලට අදාලව පළාත් පාලන දෙපාර්තමේන්තුවෙන් ලද රැඳවුම් මුදල වූ රු.391,150 තැන්පතු ලැබීම් යටතේ ගිණුම්ගත කිරීම වෙනුවට සේවා ගාස්තු ආදායම් ලෙස ගිණුම්ගත කර තිබුණි.

1.3.2 නොසැසඳු ගිණුම්
---------------------

(අ) 2017 දෙසැම්බර් 31 දිනට ලැබිය යුතු සේවක ණය, ණය ලේඛනයට අනුව රු. 1,393,590 ක් වුවද, ලෙජර් ගිණුම් අනුව එය රු.1,117,863 ක් වූ බැවින් රු.275,727 ක වෙනසක් පැවතුණි.

(ආ) 2017 දෙසැම්බර් 31 දිනට ආපසු ගෙවිය යුතු තැනපතු, තැන්පතු ලෙජරය අනුව රු.2,517,442 ක් වුවත්, මූල්‍ය ප්‍රකාශන අනුව එය රු.2,787,183 ක් වූ බැවින් රු.269,741 ක වෙනසක් පැවතුණි.

1.3.3 අවිනිශ්චිත ගිණුම

---------------------

2011 වර්ෂයේ සිට පැවත එන රු. 7,864,759 ක් වූ අවිනිශ්චිත ගිණුමේ බැර ශේෂය නිරවුල් කිරීමට ක්‍රියාමාර්ග නොගෙන ශේෂ පත්‍රයේ වගකීම් යටතේ දක්වා තිබුණි.

1.3.4 විගණනය සඳහා සාක්ෂි නොමැතිවීම

---------------------------------------------

අවශ්‍ය තොරතුරු ඉදිරිපත් නොකිරීම නිසා රු.950,536 ක් වූ ලැබිය යුතු ශේෂය හා රු.214,316 ක් වූ ගෙවිය යුතු ශේෂය විගණනයේදී සතුටුදායක ලෙස සංනිරීක්ෂණය කිරීමට නොහැකි විය.

1.3.5 නීති, රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම්

---------------------------------------------------------------------------------

විගණනයේ දී නිරීක්ෂණය වූ නීතිරීති,රෙගුලාසි සහ සහ කළමනාකරණ තීරණවලට අනුකූල නොවූ අවස්ථා පහත දැක්වේ.

| නීතිරීති සහ සහ කළමනාකරණ තීරණවලට යොමුව | අනුකූල නොවීම |
|---|---|
| (අ) 1989 අප්‍රේල් 17 දින අංක 554/5 දරන අති විශේෂ ගැසට් පත්‍රයෙන් ප්‍රකාශිත 1988 ප්‍රාදේශීය සභා (මූල්‍ය හා පරිපාලන) රීති මාලාව | |
| (i) 13 වැනි රීතිය | වර්ෂය ආරම්භවීමට පෙරාතුව අයවැයේ සහතික කරන ලද පිටපතක් විගණනය සඳහා ඉදිරිපත් කර නොතිබුණි. |
| (ii) 17 වැනි රීතිය | ලදුපත් සම්බන්ධයෙන් නිශ්චිත ආකෘතියේ දැක්වෙන උප පත්‍රිකා ලේඛනයක් පවත්වාගෙන ගොස් නොතිබුණි. |
| (iii) 76 වැනි රීතිය | සභාව විසින් කුලියට දෙනු ලබන කඩ කාමර සම්බන්ධයෙන් කුලී ලෙජරයක් පවත්වාගෙන ගොස් නොතිබුණි. |
| (iv) 143 වැනි රීතිය | ආපසු ගෙවිය යුතු ටෙන්ඩර් තැන්පතු, රැඳවුම් මුදල්, පුස්තකාල තැන්පතු සහ අනෙකුත් තැන්පතු වෙනුවෙන් වෙන් වෙන් වශයෙන් තැන්පතු ගිණුම් ආරම්භ කර නොතිබුණි. |
| (v) 217 වැනි රීතිය | ස්ථාවර වත්කම් ලේඛනයක් පවත්වාගෙන ගොස් නොතිබුණි. |

(ආ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය

---

(i) මුදල් රෙගුලාසි 571 — වර්ෂ 02 ක් ඉක්ම වූ වටිනාකම රු.59,956 ක් වූ ආපසු ගෙවිය යුතු තැන්පතු 09 ක් නිරවුල් කිරීමට හෝ ආදායමට ගැනීමට කටයුතු කර නොමැත.

(ii) මුදල් රෙගුලාසි 1646 — ගමන් පිළිබඳ මාසික සාරාංශ මුල් පිටපත් සමඟ දෛනික ධාවන සටහන් විගණනය සඳහා ඉදිරිපත් කර නොතිබුණි.

2. මූල්‍ය සමාලෝචනය

---

2.1 මූල්‍ය ප්‍රතිඵලය

---

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු. 2,657,153 ක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු. 4,801,448 ක් විය.

2.2 ආදායම් පරිපාලනය

---

2.2.1 ඇස්තමේන්තුගත ආදායම්, බිල් කළ ආදායම්, තත්‍ය ආදායම් හා හිඟ ආදායම්

---

සමාලෝචිත වර්ෂයට හා ඉකුත් වර්ෂයට අදාලව ඉදිරිපත් කර තිබූ ඇස්තමේන්තුගත ආදායම්, බිල් කළ ආදායම්, රැස් කළ ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| ආදායම් ප්‍රභවය | 2017 | | | | 2016 | | | |
|---|---|---|---|---|---|---|---|---|
| | ඇස්තමේන්තුගත ආදායම් | බිල්කළ ආදායම් | රැස්කළ ආදායම් | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය | ඇස්තමේන්තුගත ආදායම් | බිල්කළ ආදායම් | රැස්කළ ආදායම් | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය |
| | රු.000 | රු.000 | රු.000 | රු.000 | රු.000 | රු.000 | රු.000 | රු.000 |
| වරිපනම් හා බදු | 62 | - | - | - | 47 | 53 | 53 | - |
| කුලී | 4,705 | 2,687 | 2,615 | 72 | 2,785 | 4,596 | 4,596 | - |
| බලපත්‍ර ගාස්තු | 251 | 219 | 219 | - | 303 | 208 | 208 | - |
| වෙනත් ආදායම් | 3,005 | 1,494 | 1,494 | - | 3,010 | 1,469 | 1,469 | - |

2.2.2 මුද්දර ගාස්තු

----------------

නැගෙනහිර පළාත් සභාවේ ප්‍රධාන ලේකම්වරයාගෙන් 2017 දෙසැම්බර් 31 දිනට මුද්දර ගාස්තු වශයෙන් ලැබිය යුතු මුදල් හඳුනා ගැනීමට හා ඒවා අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

03. මෙහෙයුම් සමාලෝචනය

-----------------------------

3.1 කාර්යය සාධනය

--------------------

ප්‍රාදේශීය සභා පනතේ 3 වන වගන්තිය යටතේ මහජන සෞඛ්‍ය, පොදු උපයෝගිතා සේවා සහ පොදු මංමාවත් පිළිබඳ කාරණා විධිමත් කිරීම හා පාලනය කිරීම, ජනතාවගේ සුබ විහරණය, පහසුව හා සුබසාධනය යන සභාව විසින් ඉටු කළයුතුව තිබුණු කර්තව්‍යයන් ඉටු කිරීම පිළිබඳ අනාවරණය වූ කරුණු පහත දැක්වේ.

(අ) අතුරු ව්‍යවස්ථා

-------------------

ප්‍රාදේශීය සභා පනතේ 126 වගන්තිය යටතේ ප්‍රධාන කාරණා 28 ක් ඉටු කිරීම සඳහා අතුරු ව්‍යවස්ථා පැනවිය යුතුව තිබූ නමුත් 2017 දෙසැම්බර් 31 දින වන විටත් අතුරු ව්‍යවස්ථා පනවා නොතිබුණි.

(ආ) ක්‍රියාකාරී සැලැස්ම

----------------------

2017 වර්ෂය වෙනුවෙන් වාර්ෂික ක්‍රියාකාරී සැලැස්මක් පිළියෙල කර නොතිබුණි.

(ඇ) අපේක්ෂිත කාර්යය සාධන මට්ටමට ළඟානොවීම

-------------------------------------------------------

විස්තර පහත පරිදි විය.

(i) පුරනැගුම ව්‍යාපෘතිය යටතේ මහදිවුල්වැව ජනතාවගේ අවශ්‍යතාවයක් වූ මාතෘ සායන මධ්‍යස්ථානයක් පවත්වාගෙන යාම සඳහා රු.3,852,984 ක මුදලක් වැය කොට 2017 ජනවාරි 01 දින නිම කරන ලද ගොඩනැගිල්ල සඳහා විදුලිය පහසුකම් ලබා ගැනීමට සභාව විසින් කටයුතු කර නොතිබූ බැවින් ජනතාව වෙත අපේක්ෂිත සේවාවන් ලබා දීමට 2018 අප්‍රේල් 11 දින වන විටද කටයුතු කර නොතිබුණි.

(ii) පුරනැගුම ව්‍යාපෘතිය යටතේ කුලියට ලබා දීම සඳහා රු.1,521,904 වියදමින් මහදිවුල්වැව කඩකාමර දෙකක් 2016 නොවැම්බර් 08 දින නිම තිබූ අතර මෙහි රු.250,000 ක් පමණ වියදමක් දරා නානකාමර දෙකක් සකස් කර තිබූ නමුත් ඒ සඳහා ජල සැපයුම ලබා දීමට කටයුතු නොකිරීම හේතුවෙන් 2018 අප්‍රේල් 11 වන විටද එය භාවිතයට ගත නොහැකිව පැවතුණි.

(ඈ) අත්හැර දැමූ කර්තව්‍යයන්

------------------------------

පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශයේ ප්‍රතිපාදන යටතේ ප්‍රාදේශීය සභා ශක්තිමත් කිරීමේ ජාතික වැඩසටහන -2017 යටතේ මහදිවුල්වැව ප්‍රදේශයේ ජනතාවගේ අවශ්‍යතාවයක් වූ සතිපොලක් ඉදි කිරීමට 2017 ඔක්තෝබර් 06 දින ප්‍රජා සංවිධානයකට රු.1,000,000 වටිනාකමකට පවරා තිබුණි. ප්‍රජා සංවිධානය විසින් අමුද්‍රව්‍ය මිල ඉහළ බැවින් අදාළ ඉදිකිරීම කළ නොහැකි බව දක්වා ඇතත් එය සනාථ කිරීමට විධිමත් සාක්ෂි ඉදිරිපත් කර නොතිබුණි. එමෙන් ම සභාව විසින්

නැවත මෙම කොන්ත්‍රාත්තුව වෙනත් සමිතියකට හෝ කොන්ත්‍රාත්කරුවෙකුට ප්‍රදානය කිරීමට කටයුතු කර නොතිබුණි. මේ හේතුවෙන් මෙම ප්‍රදේශයේ ජනතාවගේ අවශ්‍යතාවයක් වූ සතිපොල ඉදිකිරීමේ කාර්යය 2018 අප්‍රේල් 11 දින වන විටද සිදු කර නොතිබුණි.

(ඉ) පාරිසරික ගැටළු

---------------------

පරිසර බලපත්‍ර නිකුත් කිරීම.

-----------------------------------

1988 අංක 56 සහ 2000 අංක 53 දරන පනත්වලින් සංශෝධිත 1980 අංක 47 දරන ජාතික පාරිසරික පනතේ 23 "අ" වගන්තියේ විධිවිධාන ප්‍රකාරව පාරිසරික හානි සිදු වන වී මෝල්, වඩු කර්මාන්ත, ගරාජ් සහ සිමෙන්ති ආශ්‍රිත නිෂ්පාදන ආයතන ආදී ව්‍යවසායන් ක්‍රියාත්මක කිරීමේ දී පරිසර ආරක්ෂණ බලපත්‍ර ලබාගත යුතු වුවත් සභා බල ප්‍රදේශය තුළ ක්‍රියාත්මක වන එවැනි ව්‍යවසායන් 16 ක් එම බලපත්‍ර ලබා ගැනීමකින් තොරව අදාළ කර්මාන්ත පවත්වා ගෙන යමින් තිබුණි. මේ සම්බන්ධයෙන් ඇති විය හැකි පාරිසරික ගැටළු නිරාකරණය කිරීමට සභාව විසින් අවශ්‍ය ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි.

(ඊ) තිරසර සංවර්ධන ඉලක්ක

------------------------------

සභාව විසින් තිරසර සංවර්ධන ඉලක්කයක් ලෙස පරිසරය සුරැකීම කෙරෙහි අවධානය යොමු කර තිබූ අතර අදාළ කාර්යයන් ඉටු කිරීමට අවශ්‍ය වැඩපිළිවෙල හා ඒ සම්බන්ධ නිර්ණායක හඳුනා ගෙන නොතිබුණි.

3.2 කළමනාකරණ අකාර්යක්ෂමතා

-------------------------------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) සභාව සතු ධාවනයෙහි පවතින රථවාහන 02 ක් සඳහා ප්‍රවර්ථන වර්ෂය වෙනුවෙන් ආදායම් බලපත්‍ර ලබාගෙන නොතිබුණි.

(ආ) JCB යන්ත්‍රයක් මිලදී ගැනීම සඳහා දේශීය ණය සහ සංවර්ධන අරමුදලින් මාසික වාරික 60 කින් ගෙවා නිම කිරීමට 2013 මැයි මස ලබා ගත් රු.9,520,000 ක ණය මුදල වෙනුවෙන් 2015 නොවැම්බර් මස සිට 2017 දෙසැම්බර් මස දක්වා ගෙවිය යුතු රු.4,481,789 ක් වූ ණය වාරික මුදල් හා රු.656,318 ක් වූ පොළී මුදල් ගෙවීමට 2018 අප්‍රේල් 11 වන විටත් කටයුතු කර නොතිබුණි.

(ඇ) සභාව විසින් රු.1,500,000 ක මුදලක් සියයට 8.75 ක පොළී අනුපාතයක් යටතේ 2015 දෙසැම්බර් 09 දින වර්ෂ 05 කින් කල්පිරීමට ස්ථාවර තැන්පතුවක ආයෝජනය කර තිබූ අතර කල්පිරීමේ දී රු.656,250 ක පොළී ආදායමක් ලැබිය යුතුව තිබුණි. එහෙත් කෙටිකාලීන කල් පිරීමේ කාලය සහිත ආයෝජනයන්හි පොළී අනුපාතය සාමාන්‍යයෙන් සියයට 11 ක් පමණ වන බැවින් ඒ අනුව සභාව කෙටිකාලීන ස්ථාවර තැන්පතුවක මුදල් ආයෝජනය කළේ නම් වර්ෂ 05 අවසානයේ ආසන්න වශයෙන් රු.825,000 ක පමණ ආදායමක් ලබා ගත හැකිව තිබුණි.

3.3 මානව සම්පත් කළමනාකරණය

---------------------------------------

විස්තර පහත පරිදි විය.

(අ) සේවය හැරගිය සේවකයන් සිව්දෙනෙකුගෙන් අයවිය යුතු සේවක ණය රු. 100,145 ක් ආයතන සංග්‍රහයේ XXIV වන පරිච්ජේදයේ 4 වගන්තියේ විධිවිධාන ප්‍රකාරව 2018 අප්‍රේල් 11 දින වන විටද අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

(ආ) රාජ්‍ය සේවා අර්ථසාධක අරමුදලට දායක මුදල් ගෙවීම සම්බන්ධයෙන් පහත කරුණු නිරීක්ෂණය විය.

(i) විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුවේ 2011 පෙබරවාරි 24 දිනැති අංක 02/2011 දරන විශ්‍රාම වැටුප් චක්‍රලේඛය ප්‍රකාරව සභාව විසින් ආදේශක පදනම මත බඳවාගත් සේවකයින් දෙදෙනෙකුගෙන් අයකරනු ලබන දායක මුදල් රාජ්‍ය සේවා අර්ථසාධක අරමුදලට බැර නොකර සේවක අර්ථසාධක අරමුදලට බැර කර තිබුණි.

(ii) 2015 ජුලි 23 දිනැති අංක 07/2015 දරන විශ්‍රාම වැටුප් චක්‍රෙල්ඛයේ 07 ඡේදය ප්‍රකාරව සේවකයින්ගේ මුළු මාසික ඉපයීම්වලින් දායක මුදල 20% ක් වුවද ආදේශක පදනම මත බඳවා ගත් සේවකයන් දෙදෙනෙකුගෙන් 2017 වර්ෂයේ දායක මුදල, මූලික වැටුප මත ගණනය කර තිබුණි. මේ හේතුවෙන් සේවකයාගේ හා සේව්‍යාගේ දායක මුදල රු.40,617 ක් අඩුවෙන් ගණනය කර තිබුණි.

3.4 වත්කම් කළමනාකරණය

3.4.1 පවරා නොගත් වත්කම්

පළාත් පාලන ආයතනවල නඩත්තු ඒකක සඳහා අවශ්‍ය මූලික යන්ත්‍ර සූත්‍ර ලබා දීමේ වැඩ සටහන සහ පළාත් පාලන ආයතනවල ප්‍රවාහන පහසුකම් සැලසීමේ වැඩසටහන යටතේ පළාත් පාලන අමාත්‍යාංශය මඟින් සභාවට ලබා දුන් ලොරි රථය සහ යතුරු පැදියේ අයිතිය සභාව වෙත පවරා ගැනීමට කටයුතු කර නොතිබුණි.

3.4.2 වාර්ෂික භාණ්ඩ සමීක්ෂණය

සමාලෝචිත වර්ෂය සඳහා 2018 මාර්තු 29 දින පැවැත් වූ භාණ්ඩ සමීක්ෂණය අනුව අළුත්වැඩියා කළයුතු, විනාශ කළයුතු හා විකිණිය යුතු භාණ්ඩ සම්බන්ධයෙන් සමීක්ෂණ මණ්ඩලය විසින් ඉදිරිපත් කර තිබූ නිර්දේශයන් 2018 අප්‍රේල් 11 වන විටද ක්‍රියාත්මක කර නොතිබුණි.

3.4.3 හඳුනාගත් අලාභ

සභාව විසින් මෝටර් රථ සඳහා ආදායම් බලපත්‍ර ලබා ගැනීමේදී එය නියමිත කාලය තුළ සිදු නොකිරීම නිසා රු.7,700 ක දඩ මුදලක් ගෙවා තිබුණි.

3.5 ප්‍රසම්පාදනය

3.5.1 ප්‍රසම්පාදන සැලැස්ම

2006 මාර්තු 24 දිනැති ජාතික අයවැය චක්‍රෙල්ඛ අංක 128 ට අනුව ප්‍රසම්පාදන සැලැස්මක් සකස් කළ යුතු නමුත් එසේ සිදු කර නොතිබුණි.

3.5.2 කොන්ත්‍රාත් පරිපාලනය

(අ) පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශයේ ප්‍රාදේශීය සභා ශක්තිමත් කිරීමේ ජාතික වැඩසටහන -2017 ප්‍රතිපාදන යටතේ බහුකාර්ය ගොඩනැගිල්ල සංවර්ධනය කිරීම අංක 01 ලෙස ගොඩනැගිල්ලක් ඉදිකිරීම සඳහා වටිනාකම රු.1,900,000 ක කොන්ත්‍රාත්තුවක් ප්‍රජා සංවිධානයක් වෙත ප්‍රදානය කර තිබූ අතර මෙම ගොඩනැගිල්ල ඉදි කිරීම සඳහා නාගරික සංවර්ධන අධිකාරි පනතේ සඳහන් සැලසුම් හා ගොඩනැගිලි රෙගුලාසි ප්‍රකාරව අනුමැතිය ලබා ගෙන නොතිබුණි. එමෙන්ම පළමු මහලේ කොන්ක්‍රීට් ඇතිරීම, බිත්ති

කපරාරු කිරීම, ලින්ටල් කපරාරු කිරීම හා ඇතුළත බිත්තිවල තීන්ත ආලේප කිරීම වෙනුවෙන් රු.75,375 ක මුදලක් වැඩිපුර ගෙවීමට නිර්දේශ කර තිබූ අතර කොන්ත්‍රාත්තුවෙහි වැඩ 2018 අප්‍රේල් 11 දින වන විටද නිමකර නොතිබුණි. එමෙන්ම ගොඩනැගිල්ල සඳහා අවශ්‍ය විදුලිය ලබා ගැනීමටද කටයුතු කර නොතිබුණි.

(ආ) පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශයේ ප්‍රදේශීය සභා ශක්තිමත් කිරීමේ ජාතික වැඩසටහන-2017 ප්‍රතිපාදන යටතේ මොරවැව බහුකාර්යය ගොඩනැගිල්ලේ භූමිය සංවර්ධනය කිරීම සඳහා වටිනාකම රු.1,675,000 ක ව්‍යාපෘතියක් 2017 ඔක්තෝබර් 06 වන දින ප්‍රජා සංවිධානයක් වෙත ප්‍රදානය කර තිබූ අතර එහි ප්‍රධාන කාර්යයක් වූ කුට්ටි ගල් ඇතිරීමේදී ඒවායේ ප්‍රමිතිය පරීක්ෂා කිරීම සිදු කළ යුතු විය. එහෙත් සභාව විසින් ප්‍රමිතිය පරීක්ෂා නොකර කුට්ටිගල් ඇතිරීම වෙනුවෙන් රු.1,145,285 ක් ගෙවීම සඳහා සහතික කර බිල්පත්‍ර ඉදිරිපත් කර තිබුණි.

(ඇ) පළාත් සභා හා පාළාත් පාලන අමාත්‍යාංශයේ ප්‍රාදේශීය සභා ශක්තිමත් කිරීමේ ජාතික වැඩසටහන -2017 ප්‍රතිපාදන යටතේ බහුකාර්යය ගොඩනැගිල්ලේ ඇතුළත සංවර්ධනය කිරීමේ කටයුතු සිදු කිරීම වෙනුවෙන් වටිනාකම රු.1,450,000 ක කොන්ත්‍රාත්තුවක් 2017 ඔක්තෝබර් 06 දින ප්‍රදානය කර තිබූ අතර මෙහිදී ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 5.6 ඡේදය ප්‍රකාරව පිරිවිතර සකස් කළ හැකි භාණ්ඩ හෝ වැඩ ප්‍රසම්පාදනයේ දී පිරිවිතර සකස් කර ප්‍රසම්පාදනය සිදු කළ යුතු විය. එහෙත් පිරිවිතර සකස් කිරීමෙන් තොරව ජෙනරේටරයක් මිලදී ගෙන තිබුණි. ජෙනරේටරය සඳහා රු.775,000 මුදලක් ගෙවා තිබුණු අතර එහෙත් වෙළඳපොලේ එම වර්ගයේ ජෙනරේටරයක මිල රු.690,000 ක් වූ අතර මිලදී ගැනීමේ බිල්පත්‍ර පරීක්ෂා කිරීමෙන් තොරව ගෙවීම් කිරීම හේතුවෙන් සභාව විසින් රු.85,000 ක මුදලක් වැඩිපුර ගෙවා තිබුණි. තවද ජෙනරේටරය මිලදී ගත් දින සිට එනම් 2017 නොවැම්බර් 10 සිට නිශ්කාර්යව පැවතුණි.

(ඈ) ප්‍රාදේශීය සභාව විසින් 2016 වර්ෂයෙහි පළාත් පාලන අරමුදල් යටතේ මොරවැව දකුණු ඩී.01 ගම්මාන පාර මීටර් 300 ක ප්‍රමාණයක් කොන්ක්‍රීට් කිරීම වෙනුවෙන් රු.3,711,472 ක වටිනාකමකට 2016 නොවැම්බර් 15 දින කොන්ත්‍රාත්තුවක් ප්‍රදානය කර තිබූ අතර මෙම මාර්ගය නිසි පරිදි සකස් කරනු ලබන්නේ නම් කොන්ක්‍රීට් යෙදූ 300m ප්‍රමාණය සඳහා බෝක්කු දෙකක් යෙදිය යුතුව තිබුණි. කෙසේ වුවද සභාව විසින් නිසි පරිදි ඇස්තමේන්තු සකස් නොකිරීම හේතුවෙන් බෝක්කු ඉදිකිරීමකින් තොරව කොටස් දෙකක් ලෙස කොන්ක්‍රීට් කිරීම නිසා වැසි දිනයන්හිදී පාර හරහා ජලය ගලා යාමෙන් මෙම මාර්ගයෙහි ගමනාගමනයට බාධාවක් වී තිබුණි. එමෙන්ම මෙම මාර්ගයෙහි කිලෝමීටරයක පමණ ප්‍රමාණයක් ගමනාගමනයට අපහසු තත්වයේ පැවති අතර ඉන් මීටර් 300 ක් පමණක් සභාව විසින් කොන්ක්‍රීට් කර තිබූ නමුත් ඉතිරි ප්‍රමාණය සඳහා නිසි මාර්ග පහසුකම් සකස් කිරීම නොකරන්නේ නම් මෙම මාර්ගය තුළින් ප්‍රයෝජන ලබා ගත නොහැකි වන බව නිරීක්ෂණය විය.

(ඉ) 2006 ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 5.4.4 ii ප්‍රකාරව ප්‍රජා සංවිධානවලට සුරක්ෂණයක් නොමැතිව රු.200,000 උපරිමයකට යටත්ව අත්තිකාරම් මුදල් ගෙවනු ලැබිය හැකිය. එහෙත් සභාව විසින් සුරක්ෂණයක් ලබා ගැනීමකින් තොරව ප්‍රජා සංවිධානවලට රු.200,000 ඉක්මවා අත්තිකාරම් මුදල් ලබා දී තිබූ අවස්ථා 04 ක් පැවතුණි. එමෙන්ම 2013 ජූලි 26 දිනැති අංක FC/3/3/2013 දරන මුදල් කොමිෂන් සභා චක්‍රලේඛ ප්‍රකාරව අනුමත ප්‍රජාපාදක සංවිධානයන් සඳහා ලබා දිය හැකි උපරිම කොන්ත්‍රාත් වටිනාකම මිලිනය 02 ක් වේ. එහෙත් සභාව විසින් ප්‍රජා සංවිධාන දෙකක් සඳහා එකතුව මිලියන 04 ඉක්ම වූ කොන්ත්‍රාත් 03 බැගින් ප්‍රදානය කර තිබුණි.

(ඊ) ප්‍රාදේශීය සභාව විසින් පුර නැගුම ව්‍යාපෘතිය යටතේ බහුකාර්යය ගොඩනැගිල්ලක් ඉදි කිරීම වෙනුවෙන් 2016 අප්‍රේල් 11 වන දින වටිනාකම රු.8,401,836 ක කොන්ත්‍රාත්තුවක් ප්‍රදානය කර තිබූ අතර කොන්ත්‍රාත්තුවේ කාර්යයන් 2016 සැප්තැම්බර් 12 දින වන විට අවසන් කළ යුතුවිය. එහෙත් නිම කොට තිබුණේ 2016 නොවැම්බර් 30 දින වන බැවින් ඒ අනුව අයකල යුතු වූ ප්‍රමාද ගාස්තු වන රු.327,617 ක මුදල අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

(උ) පුර නැගුම ව්‍යාපෘතිය යටතේ මයිලකුඩා වැව ප්‍රධාන මාර්ගය කොන්ක්‍රීට් කිරීමේ දෙවන අදියර සඳහා රු. 4,000,280 ක් වටිනා කොන්ත්‍රාත් ගිවිසුමක් 2016 ජූලි 08 වන දින අත්සන් කොට තිබූ අතර කොන්ත්‍රාත්තුවෙහි කාර්යයන් 2016 ඔක්තෝම්බර් 08 දින වන විට අවසන් කලයුතු විය. එහෙත් නිමකොට තිබුණේ 2017 ජනවාරි 01 දින බැවින් කොන්ත්‍රාත් ගිවිසුමෙහි 6.4 ප්‍රකාරව අයකලයුතු ප්‍රමාද ගාස්තුව රු. 168,012 ක් විය. එහෙත් අඩුකර තිබුණේ රු. 60,004 ක් බැවින් අඩුවෙන් අයකළ ප්‍රමාද ගාස්තුව රු. 108,008 ක් විය.

04. ගිණුම් කටයුතුභාවය හා යහපාලනය
------------------------------------------

4.1 අයවැය පාලනය
--------------------

සමාලෝචිත වර්ෂයේ අයවැයගත ආදායම හා වියදම සහ තත්‍ය ආදායම හා වියදම අතර සියයට 6 සිට සියයට 299 දක්වා වූ පරාසයක විචලනයක් පැවතුණි. ඒ අනුව වාර්ෂික අයවැය විධිමත් මූල්‍ය පාලන කාරකයක් ලෙස යොදා ගෙන නොතිබුණි.

05. පද්ධති හා පාලන
----------------------

පහත සඳහන් පද්ධති හා පාලන ක්ෂේත්‍ර කෙරෙහි විශේෂ අවධානය යොමු කරනු ලැබේ.

| | පද්ධතිය | අඩුපාඩුව |
| --- | --- | --- |
| (අ) | ගිණුම්කරණය | i. ආදායම් ගිණුම්ගත කිරීම<br>ii. උපයෝගී ලෙජර පවත්වා ගෙන යාම |
| (ආ) | ආදායම් පරිපාලනය | i. හිඟ ආදායම් අයකර ගැනීම<br>ii. උසාවි දඩ හා මුද්දර ගාස්තු ලබා ගැනීම |
| (ඇ) | කොන්ත්‍රාත් පරිපාලනය | ගිවිසුම්ගත කාලය තුල කොන්ත්‍රාත් නිම කිරීමට කටයුතු කිරීම. |
| (ඈ) | මානව සම්පත් කළමනාකරණය | i. සේවක පුරප්පාඩු පිරවීමට කටයුතු කිරීම.<br>ii. වැඩ බෙදීම විධිමත් පරිදි සිදු කිරීම. |